# ශ්‍රී ලංකාවේ නිර්මාණශීලී පරිසරය

ආචාර්ය වසන්ත අමරදාස / ප්‍රදීපා වර්ණසූරිය

ජාතික විද්‍යා පදනම

## පසුබිම

වසර දෙදහස් පන්සියයකටත් වඩා අධික පෞඪ ශිෂ්ඨාචාරයකට උරුමකම් කියන ශ්‍රී ලාංකීය ජාතියේ ශ්‍රේෂ්ඨත්වය අතීත වාරි කර්මාන්ත හා ගෘහ නිර්මාණ ශිල්පයෙහි මනාව නිරූපනය වේ. අනුරාධපුර, පොළොන්නරු වැනි අතීත රාජධානි පැවති නගරවල අදටත් ශේෂ වී පවතින නටඹුන්වලින් අප අතීත මුතුන්මිත්තන්ගේ ශිල්පීය නිපුණත්වය මොනවට පැහැදිලි වේ. ලොව අටවන පුදුමය ලෙස නම්කර ඇති සීගිරියේ ජල පරිවහනය සඳහා යොදා ගෙන ඇති තාක්ෂණය අදත් විදේශීය ඉංජිනේරුවන්ගේ විස්මයට හේතු වේ. අවුකන හා සමාධි පිලිම තුළින් විදහා දක්වන අපේ අතීත මූර්ති කලාවේ විශිෂ්ඨත්වය අදටත් අපේ උරුමයන් ලෙස සාඩම්බරයෙන් ලොවට හඬගා කිව හැකි දායාදයන්ය.


එවන් පෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලාංකීය ජාතියේ නිර්මාණශීලිත්වය අද වැලලී ඇති සේය. මීට ආසන්නම හේතුව ලෙස වසර 400 වඩා විදේශ ආක්‍රමාණවලට අප යටත්ව පැවතීමෙන් අප සමාජ සංස්කෘතිය තුළ වපුරන ලද විදේශ ගැති භාවය දැක්විය හැකිය. අදටත් විදේශයෙන් එන භාණ්ඩ හා නිෂ්පාදන අගයමින් ශ්‍රී ලාංකීය නිෂ්පාදන අඩු තක්සේරු කිරීමේ තත්ත්වයට ලාංකිකයා පත්ව ඇත්තේ ඒ ඇති කළ මානසික තත්ත්වය නිසා බව හැඟේ. එවන් වූ දීන මානසියකත්වයට තිත තබා ජාතික නිෂ්පාදනවලට ප්‍රමුඛත්වය දෙන ආර්ථික සංවර්ධනයක් තුළින් ජාතියක් ලෙස නැගී සිටීමේ අවශ්‍යතාවය අදට වඩා හෙට අපට වැඩිපුර දැනෙනු ඇත.

සිංගප්පූරුව, තායිවානය හා කොරියාව වැනි රටවල මින් වසර 20 කට ඉහත ආර්ථික තත්ත්වය ශ්‍රී ලංකාවේ අද පවතින තත්ත්වයටද වඩා පහලින් තිබුනද මෙවන් ටික කාලයක් ඇතුළත ලොව දියුණු රටවල ආර්ථික සංවර්ධනයට හා සමානව නැගීසිටීමට ඔවුන්ට හැකිව ඇත්තේ කායිකව වෙහෙස වීම නිසාම පමණක් නොව ඉදිරි දැක්මක් ඇතිව මනා කළමනාකාරීත්වයක් තුළින් විශිෂ්ඨ නායකත්වයක් යටතේ පැමිණි ගමනක ප්‍රතිඵලයක් ලෙසය.

**ශ්‍රී ලංකාව ගත් කළ කැපී පෙනෙන ප්‍රධාන කරුණක් වනුයේද අප රටේ නිර්මාණශීලී පසුබිම (Innovation Environment of Sri Lanka) කෙරෙහි යටිතල පහසුකම්වල අඩු වීමක් හෝ පැසසුම් දායී ආරම්භයන් නැති නිසා හෝ නොව එවායේ මනා කළමනාකාරීත්වයක් හා නොකඩවා පවත්වා ගෙන ඉදිරියට යාමක් දක්නට නොලැබීමයි. මේ පිළිබඳව දේශපාලන ප්‍රතිපත්තීන් තුළ සැබෑ උනන්දුවක් තිබීම අනිවාර්යයෙන්ම අවශ්‍ය වනු ඇත.**

## වර්තමාන තත්ත්වය

රටක නිර්මාණශීලී පසුබිම ගැන සාකච්ඡා කිරීමේදී ඒ හා සම්බන්ධ ප්‍රධාන අංග පහත සටහනේ පරිදි විස්තර කළ හැකිය.




**රූප සටහන 1.**
**ජාතික නිර්මාණශීලී පද්ධතියේ කොටස්**

## අධ්‍යාපන පද්ධතිය

ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන පද්ධතිය ප්‍රාථමික, පහල ද්විතීයික හා ඉහල ද්විතීයික ලෙස පාසල් අධ්‍යාපනය ද, තෘතීක ලෙස විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වාද දිවේ. ප්‍රාථමික අධ්‍යාපනය වසර 6 ක් ද, පහල ද්විතීයික අධ්‍යාපනය වසර 5 ක් ද ලැබීමෙන් පසු රජය විසින් පවත්වන අ.පො.ස. (සා/පෙ) විභාගයට පෙනී සිටිය යුතු අතර, ඉන් සමත්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තවත් වසර 2 ක අධ්‍යාපනයෙන් පසු රජය විසින් පවත්වන අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිටිය යුතු වේ. ඉන් සමත්වන සිසුන්ගෙන් 3% ක පමණ ප්‍රමාණයක් පමණක් වර්තමානයේදී විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබාගනී. 1938 සිට ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුටම නොමිලේ අධ්‍යාපනය ලබා දෙනු ලැබේ. මේ වෙනුවෙන් ලාංකීය රජය වාර්ෂිකව රුපියල් බිලියන ගණනක් වැය කරනු ලබයි. මේ නිසාවෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 92% වැනි ඉහල අගයක පවත්වා ගෙන යාමට හැකි වී ඇත. මෙම අගය දකුණු සහ බටහිර ආසියාවේ උපරිම සාක්ෂරතා අගය ලෙස යුනෙස්කෝ ආයතනය විසින් 2005 දී කරන ලද සමීක්ෂණයක් මගින් හෙළි වී ඇත.

දැනට රජයෙන් පාලනයවන විශ්ව විද්‍යාල 13 කින් සමන්විත විශ්ව විද්‍යාල පද්ධතිය නඩත්තුව වෙනුවෙන් වාර්ෂිකව විශාල මුදලක් වැය කරන අතර පසුගිය වසර කිහිපය තුළ ඒවායේ යටිතල පහසුකම් සැපයීම සඳහා අමතරව විශාල මුදලක් වැය කරන ලදී.

දැනුම මූලික ආර්ථික යුගයක ජීවත්වන අප ශ්‍රී ලංකාවේ සෑම රජයක්ම අධ්‍යාපනය වෙනුවෙන් නොකඩවා විශාල මුදලක් වැය කිරීම සතුටු විය හැකි කරුණකි. එනමුත්, එම පද්ධතියේ පවත්නා නොයෙකුත් දුර්වලතා හේතුවෙන් අදවන් විශව විද්‍යාලවලින් පිටවන වෛද්‍ය හා ඉංජිනේරු උපාධිධාරීන් අනිකුත් උපාධියාරීන්ගෙන් 29.5% ක් රැකියා විරහිත බව ජාතික විද්‍යා පදනම 2004 වර්ෂයේ පවත්වන ලද සමීක්ෂණයක් තුළින් හෙළි වී ඇත. මෙයට ප්‍රධාන හේතුවක් ලෙස ලංකාව තුළ වැඩිම රැකියා වෙළඳපොළක් පවතින පෞද්ගලික අංශයේ අවශ්‍යතාවන්ට අනුකූලව උපාධිධාරීන් බිහිකිරීමට ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපන පද්ධතියට තවමත් නොහැකිවීම බව අපේ හැඟුමයි. මේ බව තේරුම් ගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඇතුළු විශ්ව විද්‍යාල රැසක් ඒ අවශ්‍යතාවන්ට අනුව විෂය නිර්දේශ වෙනස් කිරීමට කටයුතු යොදා ඇති අතර පරිගණක විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව හා කළමනාකරණය යන විෂය කොටස්ද, සෑම විෂය නිර්දේශයකටම ඇතුළ කිරීමට කටයුතු යොදා ගෙන ඇත. මෙම තත්ත්වය දිගටම පැවතිය හොත් එනම් වෙනස්වන අවශ්‍යතාවන් අනුව පාඨමාලා වෙනස් වීම කඩිනමින් සිදු වුව හොත්, තවත් වසර 5 කදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ සතුටුදායක තත්ත්වයක් ඇතිවන බවට අනාවැකි පළ කළ හැකිය.

## මූල්‍ය පද්ධති

ලංකාවේ මූල්‍ය පද්ධතිය වාණිජ බැංකු, මූල්‍ය සංවර්ධන ආයතන, උසස් බැංකු යන ආයතනවලින් සමන්විතවන අතර, මහ බැංකුව මෙම සෑම මූල්‍ය ආයතනයකම ප්‍රධාන ආයතනය ලෙස කටයුතු කරයි. වාණිජ බැංකු 26 කින් සමන්විත බැංකු පද්ධතියේ බැංකු 10 ක් පමණක් ලාංකික බැංකුවන අතර, අනෙක්වා විදේශ බැංකුවල ශාඛා ලෙස පවත්වා ගෙන යනු ලැබේ.

අතීතය හා සංසන්දනය කිරීමේදී ලංකාවේ මූල්‍ය පද්ධතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇති අතර, ඒ අතරින් පෞද්ගලික අංශය තුළින් සිදුවන මෙහෙවර අති මහත්ය. නව තාක්ෂණික මෙවලම් හඳුන්වා දෙමින් පෞද්ගලික බැංකු අතර පවතින තරඟකාරී පරිසරය රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ධනාත්මකව බලපා ඇති බව සැලකිය යුතු කරුණකි. මේ කෙසේ වෙතත් තවමත් ලංකාවේ වාණිජ ආයතන තාක්ෂණ දියුණු කිරීම් ආශ්‍රිතව ව්‍යාපෘති සඳහා මූල්‍යමය ප්‍රතිපාදන සැපයීමට මැලිකමක් දක්වනුයේ එම තාක්ෂණය සම්බන්ධයෙන් ව්‍යාපෘතිවල පවතින අවදානම වැඩි නිසාය. රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි නව නිර්මාණවල දායකත්වය පිළිබඳ ඔවුන් තුළ ඇති දැනුමද, දේශීය නිර්මාණ හා තාක්ෂණය කෙරෙහි දක්වන ආකල්ප මඳකමද මෙයට මූලික හේතුව වී ඇත. පෞද්ගලික අංශය බොහෝ විට තම ව්‍යාපාරවල දියුණුව හා එහි ලාභය ගැන වැඩිපුර සැලකිලිමත්වන අතර, රටෙහි සංවර්ධනය පිළිබඳ යොමුවීම ඉතා අඩු බැවින් ඒ සඳහා රජයේ මැදිහත් වීම වඩා වැදගත්ය. අවදානම් සහිත වුවද අනාගතයේදී රටේ සංවර්ධනයට ආයෝජනයක්වන ව්‍යාපෘතීන් හඳුනා ගෙන රාජ්‍ය බැංකු හරහා ඒ සඳහා ණය පහසුකම් ලබාදීම රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස එළි දැක්විය යුතුය. වර්තමාන රජය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා පිහිටුවන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බැංකුව (SME Bank) අනාගතය උදෙසා රජය මගින් සිදු කළ වැදගත් ආයෝජනයක් ලෙස හඳුන්වාදිය හැකිය. නමුත්, දියුණු වෙමින් පවතින රටක රජයක් ලෙස රාජ්‍ය අංශයට දැරිය හැකි මූල්‍ය ප්‍රතිපාදන සීමා සහිත නිසා රජය මගින් රටේ මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා මුදල් වෙළඳපොළක් (Capital Maket) ඇති කිරීම හා නව නිපැයුම් උදෙසා ව්‍යාපාර ප්‍රාග්ධනය සැපයීමේ (Venture Capital Financing) ලා නව වැඩ පිළිවෙලක් ඇති කිරීම කාලෝචිතය.

## සාර්ථක ව්‍යවසායකත්වය

සමස්තයක් ලෙස ගත් කල ලාංකීය සමාජයේ සාර්ථක ව්‍යවසායකයන් දක්නට ලැබෙන්නේ අතලොස්සකි. ලාංකීය වෙළඳපොළ මහා පරිමාණ ව්‍යවසායිකයන් කිහිප දෙනෙකුගේ ආධිපත්‍යයට යටත් වී ඇති අතර, ඒවා අතරින් සැලකිය යුතු වෙළඳ ව්‍යාපාර ප්‍රමාණයක් බහු ජාතික කර්මාන්තකරුවන්ට අයත් ඒවා වේ. වෙළඳ ව්‍යාපාරික නිර්මාණශීලීත්වය කෙරෙහි එම ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන සහා යොමු වීම, නිෂ්පාදනය සඳහා තාක්ෂණික මෙවලම් යොදාගැනීම්, වෙළඳපොළ සංවර්ධනය හා මානව සංවර්ධනය යන කරුණු පිළිබඳ දක්වන සැළකිල්ල ඉතා වැදගත්ය. ලාංකීය කර්මාන්තකරුවන් රැසක්ම සාම්ප්‍රදායික තාක්ෂණය පමණක්ම යොදා ගැනීමෙන් ලාභය ගැන වැඩිපුර සිතනවා විනා ගෝලීයකරණය තුළින් ඔවුන්ගේ ඉදිරි පැවැත්මට ඇති තර්ජනය ගැන දක්වන සැලකීම අඩුය. ඒ නිසාවෙන් නව තාක්ෂණය හඳුන්වාදීම, නව නිර්මාණ කෙරෙහි යොමු වීම, භාණ්ඩවල ප්‍රමිතිය වැඩි කිරීම හා තම සේවක දක්ෂතාවයන් දියුණු කිරීම වැනි වැදගත් අංශ කෙරෙහි ශ්‍රී ලාංකික කර්මාන්තකරුවන්ගේ යොමු වීම මඳක් අඩු බව අපේ හැඟීමයි.

නමුත්, ඉහත සියළු කරුණු කාරණා පිළිබඳ මනා අවබෝධයක් ඇති විදේශ වෙළඳපොළ ජයගත් ලාංකීය කර්මාන්තකරුවන් රැසක්ම අද වෙළඳපොළේ දක්නට ලැබේ. ලාංකික ආර්ථිකයට හා එහි නිර්මාණශීලී පද්ධතියට ඔවුන්ගෙන් ලැබෙන පිටිවහල අවතක්සේරු කළ නොහැකිය.

එනුමත් ලාංකීය සමාජයට ආවේණික වූ ගුණාංග හේතුවෙන් ඔවුන්ගේ දියුණුවේ මංපෙත් බොහෝ විට වාණිජ රහස් ලෙස පවත්වා ගෙන යයි. එය අනාගතයේ ඇතිවන නව නිර්මාණවල වර්ධනයට බාධාවක් විය හැකිය.

## රටක නිර්මාණශිලිත්වය නැංවීමේලා එහි රජයේ දායකත්වය හා වගකීම

රටක නිර්මාණශීලී පසුබිම කෙරෙහි රජයේ දායකත්වය ඉහත සඳහන් කළ අධ්‍යාපන, පෞද්ගලික ව්‍යවසාය හා මූල්‍ය පද්ධති තුළින් ගොඩනැගෙන අතර, එයට අමතරව අනුරූප පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධනය, නිර්මාණශීලී කටයුතු සඳහා මූල්‍යමය පහසුකම් සැලසීම හා දිරිගන්වන සුළු නීති රීති පද්ධතියක් සැකසීම යන දෑ නිර්මාණශීලී පසුබිම වඩා ඔපමට්ටම් කරයි.

## පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධනය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුග්‍රහය යටතේ දැනට පර්යේෂණ ආයතන 19 ක් පවත්වා ගෙන යන අතර ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්ව විද්‍යාල 13 කද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සෘජුව හා වක්‍රව මුදල් සම්පාදනය කරන්නේද, රජය මගිනි. ලංකාවේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැයවන මුළු මුදලින් 70% ක් රජය මගින් දරණ අතර, 20% ක ප්‍රමාණයක් විදේශ ආයතන (ලෝක බැංකුව, යුනිඩෝ, සීඩා) මගින් දරයි. ඉතිරි 10% ක පමණ සුළු කොටසකට දායකත්වය සපයන්නේ පෞද්ගලික අංශයයි. රජය මගින් 70% ක දායකත්වයක් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ලබා දුන්නද එය දළ ජාතික නිෂ්පාදයෙන් 0.18% ක පමණ කුඩා ප්‍රමාණයක් බව සැලකිය යුතුය.

පසුගිය වර්ෂ කිහිපය තුළ මෙම රාජ්‍ය අංශයේ ආයතන තුළින් කරන ලද පර්යේෂණ හරහා වෙළඳපොළට හඳුන්වා දෙන ලද නව නිපයුම් ලෙස දැලි නොබැඳෙන දර උඳුන් හා තේ දළු තෙලන මැෂින් ඇතුළු නිර්මාණ රැසක් ඉදිරිපත් කළ හැකි වුවද සමස්තයක් ලෙස ගත් කල රටේ ආර්ථිකයට එම ආයතනවලින් ඉදිරිපත්වන නව නිර්මාණ තුළින් ලැබෙන දායකත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බව අපේ හැඟුමයි. මෙහිදී ලාංකීය පර්යේෂකයන් හා විද්‍යාඥයන් තුළ පවතින ව්‍යවසායකත්වය, කළමණාකරණය හා වෙළඳපොළ පිළිබඳ දැනුම අඩු බව දැකිය හැකිය. මේ සඳහා මූළු පද්ධතියම විශ්ව විද්‍යාලද ඇතුළුව අනාගත දැක්මක් සහිතව සැලසුම් විය යුතු අතර, එය දේශපාලනීකරණය නොවී යුගයේ අවශ්‍යතාවයන් අනුව හැඩ ගැසී පවත්වා ගත යුතුය.

## නිර්මාණ කටයුතු සඳහා මූල්‍යමය පහසුකම් සැපයීම

රජයේ පර්යේෂණ ආයතන හා විශ්ව විද්‍යාලවලට දක්වන දායකත්වයට අමතරව, නව නිපැයුම් දිරිමත් කිරීම සඳහා රජය මගින් නව නිපැයුම් කොමිසමක් පිහිටුවා ඇත. නව සොයාගැනීම්, නව නිපැයුම් ලෙස වෙළඳපොළ කරා යැවීම සඳහා අතහිත දෙනු පිණිස රජය මගින් 1998 දී නව නිපැයුම් සඳහා ජනාධිපති අරමුදලින් වෙනම අරමුදලක් පිහිටුවනු ලැබිය. මෙහිදී නිර්මාණකරුවන්ට තම නිර්මාණ වෙළඳපොළ දක්වා යැවීම දියුණු කිරීමට ආධාර මුදල් හෝ ණය ක්‍රමයට මුදල් සපයා දෙනු ලබයි. ඊට අමතරව පසුගිය වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනම මගින් ද නව වැඩපිළිවෙළවල් දෙකක් යටතේ නව සොයාගැනීම්, නව නිපැයුම් ලෙස වෙළඳපොළ කරා යැවීම සඳහා පෞද්ගලික අංශයටද ඇතුළුව මුදල් ආධාර ලබාදීමට කටයුතු ආරම්භකර ඇත.

## නීති හා ප්‍රතිපත්ති

රටක නිර්මාණශීලීත්වය කෙරෙහි රජයක නීතිමය හා ප්‍රතිපත්තිමය දායකත්වය සැලකීමේදී ඉහත සඳහන් අධ්‍යාපන හා මූල්‍ය ක්ෂේත්‍ර මෙන්ම රටේ ආර්ථිකයේ කොඳු නාරටියවන් පෞද්ගලික ව්‍යාපාර රටේ ආර්ථිකයට වැඩදායී ලෙස පවත්වා ගෙන යාමට අදාල නීති හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමද වැදගත් වේ. මෙහිදී පෞද්ගලික ව්‍යාපාර සඳහා මූල්‍යමය මෙවලම් ලෙස බදු සහන, දිරි දීමනා හා පර්යේෂණ ආධාර සැපයීම තුළින් නව නිපැයුම් සඳහා රජය මගින් විශේෂ දායකත්වයක් ලබා දෙනු ලැබේ. ඊට අමතරව රටේ නිර්මාණශීලීත්වයට අත්වැලක් සපයනු පිණිස බුද්ධිමය දේපල කාර්යාලය (NIPO) පිහිටුවා ඇත. මේ මගින් නව නිර්මාණකරුවන්ගේ නිර්මාණ සඳහා නීතිමය ආරක්ෂාව ලබාදේ. මීට අමතරව විද්‍යාත්මක පර්යේෂණ කරගෙන යනු පිණිස නිපුන පර්යේෂකයන් හා විද්‍යාඥයින් ඇති කිරීම හා ඒ අය නව නිර්මාණ තුළින් රටේ ආර්ථිකයට යොමු කිරීම සඳහා අදාල නීති හා ප්‍රතිපත්ති සම්පාදනයද පවතින රජයේ වගකීමයි. මෙලෙස සැලකීමේදී රජයමගින් රටේ නිර්මාණශීලීත්වය නැංවීමෙහි ලා දැනට දියත් කරන ලද ප්‍රයත්නයන් ප්‍රසංසා කටයුතු වුවද සමස්තයක් ලෙස ගත් කල ඒ තුළින් රටේ ආර්ථිකය වෙත ලැබුන දායකත්වය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකිය. මෙයට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක්කේ ඉහත සඳහන් කළ විවිධ ක්ෂේත්‍ර තුළින් සිදුවන සේවාවන් රජය මගින් මනා ලෙස සම්බන්ධීකරණයක් හා කළමනාකරණයක් සිදු කොට නොමැතිවීම විය හැකිය. ලාංකීය සමාජය තුළ දක්නට ලැබෙන සෘනාත්මක ආකල්පද රටක් ලෙස සාර්ථකත්වය නොලැබීම කෙරෙහි වක්‍රව බලපා ඇති බව අපේ හැඟීමයි. මෙ අනුව රජයක් ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රයේ පටන් මූල්‍යමය, පෞද්ගලික ව්‍යවසාය, විද්‍යා හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ආනාගත දැක්මක් ඇතිව මනා කළමනාකරණයෙන් සංවිධානය කළ යුතුව ඇති අතර, ඒවා යුගයේ අවශ්‍යතාවන් අනුව වෙනස් කරමින් පවත්වා ගෙන යෑම සඳහා ඊට අදාල නීති හා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුව ඇත.

අවසාන වශයෙන් රටක් ලෙස කල් පවත්නා ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගැනීමට නම් අධ්‍යාපන, මූල්‍ය, පෞද්ගලික ව්‍යවසාය, විද්‍යා හා තාක්ෂණ යන සියළුම ක්ෂේත්‍ර අතර මනා සම්බන්ධීකරණයක් ඇතිව අනාගත දැක්මක් තුළින් රටට අනුකූල නව නිපැයුම් ප්‍රතිපත්තියක් (Innovation Policy) හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් බව නොකිව මනාය.